# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය (මාර්ගගත)
## පළමු සෙමෙස්තරය – 2020/2021
## BST 4181 – බෞද්ධ කලාව හා ගෘහනිර්මාණ ශිල්පය III
## විවෘත ග්‍රන්ථ ලිඛිත පරීක්ෂණය

**ශිෂ්‍යයන් සඳහා උපදෙස්:**

1. ප්‍රශ්න පත්‍රය දෙවන පිටුවේ සිට ආරම්භ වේ.
2. සියලුම ලිඛිත ඇගයීම් **<u>අත් අකුරින් පමණක්</u>** ලිවිය යුතුය. ඔබේ අත් අකුරු <u>පැහැදිලි ව ලිවීමට වග බලා ගන්න.</u>
3. ඔබේ පිළිතුරු A4 ප්‍රමාණයේ කඩදාසියක ලියන්න (සීආර් කොළ හෝ ෆුල්ස්කැප් කොළ මේ සඳහා භාවිත කළ හැකිය). පිළිතුරු ලිවීමේ දී කළු බෝල් පොයින්ට් පෑනක් භාවිත කිරීම සුදුසු වේ.
4. සාමාන්‍ය පරීක්ෂණයකදී මෙන් ඔබේ පිළිතුරු පරිගණකගත කිරීම හෝ යතුරු ලියනය කිරිමට අවසර නොලැබේ. නමුත් දෘශ්‍යාබාධිත සිසුන් වැනි විශ්වවිද්‍යාල පාලනාධිකාරිය විසින් අවසර ලබා දී ඇති සිසුන් සඳහා මෙම නියමය අදාළ නොවේ.
5. කරුණාකර **<u>ඔබේ විභාග අංකය පිළිතුරු පත්‍රයේ සෑම පිටුවකම ඉහළ දකුණු කෙළවරේ</u>** සටහන් කරන්න. පිළිතුරු පත්‍රයේ කිසිදු ස්ථානයක ඔබේ නම සඳහන් කිරීමෙන් වළකින්න.
6. පහත දැක්වෙන ආකෘතිය භාවිත කර පිළිතුරු පත්‍රයේ **<u>පහළ පිටු</u>** අංකනය කරන්න: උදා. එය පිටු 5 කින් සමන්විත නම් 1/5, 2/5… ආදී වශයෙන්.
7. ඔබේ පිළිතුරු පත්‍රයේ පළමු පිටුව ලෙස **<u>පොදු මුල් පිටුව</u>** (එය LMS මගින් ලබාගත හැකි ය.) භාවිත කරන්න (බලන්න: ඇමුණුම I). අදාළ පොදු මුල් පිටුව මුද්‍රණය කිරීමෙන් හෝ අත් අකුරින් පිටපත් කිරීමෙන් ඔබට ලබා ගත හැකි වේ.
8. පිළිතුරු පත්‍රයේ **<u>මුළු පිටු ගණන</u>** ඔබේ පිළිතුරු පත්‍රයේ මුල් පිටුවේ සඳහන් කළ යුතු ය.
9. **<u>පිළිතුරු පිටපතෙහි ඡායාරූප පරිලෝකනය කර (Scan) එය තනි PDF ගොනුවකට පරිවර්තනය කරන්න</u>**. පරිලෝකනය කරන ලද රූපයේ සම්පූර්ණ පිටුව නිසියාකාරව ආවරණය වී ඇති බවට වග බලා ගන්න.
10. පිළිතුරු පත්‍රයේ පරිලෝකනය කළ රූපය පැහැදිලි හා කියවිය හැකි බවට වග බලා ගන්න.
11. LMS වෙත තනි පිටු වෙන වෙනම උඩුගත කිරීමට (Upload) ඉඩ නොදෙන බව සලකන්න.
12. **පිළිගත හැකි එකම ගොනු ආකෘතිය PDF වේ**. **<u>අපේක්ෂකයාගේ විභාග අංකය PDF ගොනුවේ නාමය ලෙස භාවිත කළ යුතු ය.</u>** උදා. A 12345.
13. ඔබගේ පිළිතුරු පත්‍රය JPEG/JPG හෝ වෙනත් ගොනු වර්ගයකින් උඩුගත කිරීමට (Upload) ඔබට අවසර නොලැබේ.
14. ඔබගේ ලිඛිත පරීක්ෂණවල අවසාන අනුවාදය **<u>පැය 05 ක් ඇතුළත</u>** LMS වෙත උඩුගත කිරීමට (Upload) කටයුතු කරන්න .
15. ඔබගේ පිළිතුරු පත්‍රය නිසි ආකාරයට යොමු කළ බව සනාථ කරගැනීම සඳහා 'ඉදිරිපත් කරන ලදී (Submitted)' යන වචනය සමඟ LMSහි **<u>සම්පූර්ණ පිටුවේ තිර රුවක් (Screen shot)</u>** ගන්නා ලෙස සිසුන්ට උපදෙස් දෙනු ලැබේ.
16. LMS වෙත පිළිතුරු පත්‍රයක් උඩුගත කිරීමේදී (Upload) යම් තාක්ෂණික ගැටලුවක් ඇති වේ නම් අපේක්ෂකයෙකුට ඔවුන්ගේ පිළිතුරු පිටපත විද්‍යුත් තැපෑලෙන් exam4@arts.cmb.ac.lk වෙත හැකි ඉක්මණින් යොමු කරන්න.

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## ශාස්ත්‍ර පීඨය
# ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය (මාර්ගගත)
# පළමු සෙමෙස්තරය – 2020/2021
## BST 4181 – බෞද්ධ කලාව හා ගෘහනිර්මාණ ශිල්පය III
## විවෘත ග්‍රන්ථ ලිඛිත පරීක්ෂණය

- කාලයඃ **පැය 05** ක් තුළ පිළිතුරු සම්පූර්ණ කොට පිළිතුරු පත්‍රය LMS වෙත උඩුගත කළ යුතුය.
- ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු (ලකුණු 20 බැගින්) හිමිවේ.
- එක් ප්‍රශ්නයකට ඔබගේ පිළිතුරු **වචන 1000කට** නොවැඩි විය යුතුය.

---

1. දාඕ ආරාම කලාව හඳුන්වා, එය බෞද්ධ ආරාම ශිල්පය සමග සුසංයෝග ව වර්ධනය වූ ආකාරය පෙන්වා දෙන්න.

   නැතහොත්

   චීනයෙහි බුද්ධ ප්‍රතිමාවල නිරූපිත මුද්‍රා සංක්ෂිප්ත ව හඳුන්වා, එරට විවිධ යුගවල බුද්ධ ප්‍රතිමා කලාවේ විකාශය සාධක සහිත ව පැහැදිලි කරන්න.

2. චීනයෙහි අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පයෙහි විකාශය සැකෙවින් දක්වා, ඒ ඇසුරින් නිර්මාණය වූ ප්‍රතිමා කලාවෙහි සිදු වූ වර්ධනය සමාලෝචනය කරන්න.

3. නැගෙනහිර ආසියානු රටවල බෞද්ධ ස්තූප කලාව දේශිය අනන්‍යතා ලක්ෂණ සහිත ව වර්ධනය වීම විස්තර කොට, ඡාන් බෞද්ධ සම්ප්‍රදායෙහි කලාව හා වාස්තු විද්‍යාව එහි ලා ඇති කළ බලපෑම විමර්ශනය කරන්න.

4. සෙන් බෞද්ධ සම්ප්‍රදාය ජපාන සංස්කෘතියට හඳුන්වා දුන් කලාංග සංක්ෂිප්ත ව විග්‍රහ කොට, ජපන් ''සුමි ඒ සිතුවම් කලාව'' පිළිබඳ ප්‍රාමාණික විස්තරයක් සපයන්න.

5. ''නැගෙනහිර ආසියානු ගෘහ නිර්මාණ ශිල්පය, චීන බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පයේ ආභාසයෙන් ප්‍රචලිත වුව ද ජපානයේ හා කොරියාවේ එය වෙනස්කම් සහිතව වර්ධනය විය.'' සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

********************